2015 සැප්තැම්බර් මස 22 වන දින

අභිනවයෙන් ආරම්භ කරන ලද

ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය යටතේ

එදින සිට 2015 දෙසැම්බර් 31 දක්වා

ක්‍රියාත්මක කළ වැඩසටහන් වල ප්‍රගතිය හා

2016 වසරේ දියත් කිරීමට සැළසුම් කර ඇති වැඩසටහන්

මෙම වාර්තාවට ඇතුළත් වේ

**ගරු අමාත්‍යතුමාගෙන් .......**



ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය අභිනවයෙන් පිහිටුවා ගතවූ කෙටි කාලය තුළ ලබා ගත් ප්‍රගතිය හා ඉදිරි සැළසුම් පිළිබඳව සැකසෙන මෙම කාර්ය සාධන වාර්තාවට පණිවුඩයක් නිකුත් කිරීමට අවස්ථාව ලැබීම පිළිබඳව සතුටු වෙමි.

2015 ජනවාරි මස 08 වැනි දින ලබා ගත් විජයග්‍රහණයේ ප්‍රතිඵලයක් ලෙස පිහිටුවන ලද දින 100 ආණ්ඩුවේ ප්‍රතිපත්ති ඉදිරියට ගෙන යාම සහ 2015 අගෝස්තු මස 17 දින ජයග්‍රහණයත් සමග පිහිටුවන ලද යහපාලන ආණ්ඩුවේ දැක්ම හා ප්‍රතිපත්ති යථාර්ථයක් බවට පත් කර ගැනීම සඳහා අතිගරු ජනාධිපතිතුමාගේ හා ගරු අග්‍රාමාත්‍යතුමාගේ ආශීර්වාදය මත 2015 සැප්තැම්බර් 22 වන දින මෙම අමාත්‍යාංශය ස්ථාපනය කරන ලදී. ඒ අනුව සාම්ප්‍රදායික වශයෙන් හුදෙක්ම තවත් අමාත්‍යාංශයක් ස්ථාපනය කරනු වෙනුවට, නව දැක්මක් සහ විද්‍යානුකූල පදනමක් මත ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය පිහිටුවන ලද අතර සත්‍ය වශයෙන්ම මෙම අමාත්‍යාංශය රාජ්‍ය නිලධාරීන්ට මෙන්ම අදාළ සියළු පාර්ශවකරුවන්ටද නවමු අත්දැකීමක් ලබා දෙනු ඇතැයි මම විශ්වාස කරමි.

ඒ අනුව වර්ෂ 2020 දී අප රටේ අපනයන ආදායම ඇමරිකානු ඩොලර් බිලියන විසි පහක් දක්වා වැඩිකිරීම හෙවත් දෙගුණ කිරීම අරඹයා ප්‍රාථමික කර්මාන්ත ක්ෂේත්‍රය තුළින් ලබා දිය යුතු දායකත්වය නොපිරිහෙලා ලබා දීම මෙම අමාත්‍යාංශය ස්ථාපනය කිරීමේ මූලික අභිමතාර්ථයයි. ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති, වැඩසටහන්, ව්‍යාපෘති සැළසුම් කොට ක්‍රියාත්මක කිරීම අප වෙත පැවරෙන ප්‍රමුඛ කාර්ය භාරය වන අතර, එම කාර්යය අමාත්‍යාංශයක් වශයෙන් නොපිරිහෙලා ඉටු කළ හැකි බව මගේ විශ්වාසයයි. ප්‍රාථමික කර්මාන්ත යනු ඉතා විශාල ක්ෂේත්‍රයක් පුරාවට පැතිර ඇති විෂයයක් වන අතර, එම ක්ෂේත්‍ර තුළට සම්බන්ධ වන තවත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ආයතන මෙන්ම පෞද්ගලික අංශයේ ව්‍යාපාරිකයන් රාශියක්ද සිටිති. ඒ අනුව මීට සම්බන්ධ අනෙකුත් ගරු අමාත්‍යවරුන් මෙන්ම සියළුම පාර්ශවකරුවන් සමග මනා සම්බන්ධීකරණයකින් යුක්තව අමාත්‍යාංශය මෙහෙයවීම මාගේ අපේක්ෂාවයි.

මේ සඳහා අදාළ සියළු පාර්ශවයන් සමග සහභාගීත්ව ප්‍රවේශයක් ඔස්සේ අන්‍යෝන්‍ය අවබෝධයකින් යුක්තව කටයුතු කිරීම අත්‍යවශ්‍ය සාධකයක් වන අතර, එය මා ඉහත සඳහන් කළ පරිදිම මෙතෙක් කලක් අප රටේ භාවිතාව වන අමාත්‍යාංශ තනි තනිව ක්‍රියාත්මක වීමේ සම්ප්‍රදායට මෙම අමාත්‍යාංශය නවමු අත් දැකීමක් එක් කරනු ඇත.

මෙම සුවිසල් කාර්ය භාරය ඉටු කිරීම සඳහා මාගේ අමාත්‍යාංශ ලේකම්වරයා ඇතුළු කාර්ය මණ්ඩලය ගන්නා උත්සාහය අගය කළ යුතු අතර, නව අමාත්‍යාංශයක් වශයෙන් ස්ථාපනය වූ මෙම අමාත්‍යාංශය තුළින් 2015 වසරේ ගතවූ මාස තුනකට ආසන්න කෙටි කාලයක් තුළ ලබා ගෙන ඇති ප්‍රගතිය හා ඉදිරි සැළසුම් සම්බන්ධයෙන් මාගේ ප්‍රශංසාව හිමිවන බවද විශේෂයෙන් සඳහන් කරමි.

දයා ගමගේ (පා.ම.)

ප්‍රාථමික කර්මාන්ත අමාත්‍ය

**ලේකම්තුමාගෙන් .........**



2015 සැප්තැම්බර් මස 22 වන දින නව අමාත්‍යාංශයක් වශයෙන් ආරම්භ කරන ලද ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය මගින් ගතවූ කෙටි කාලය තුළ අත් කර ගත් ප්‍රගතිය හා ඉදිරි සැළසුම් සම්බන්ධයෙන් සකස් කොට එළි දැක්වෙන මෙම කාර්ය සාධන වාර්තාවට පණිවුඩයක් නිකුත් කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි.

2015 ජනවාරි 08 හා අගෝස්තු 17 දින සිදුවූ පරිවර්ථනයන්හි ප්‍රතිඵලයක් ලෙස පිහිටුවන ලද නව රජයේ ප්‍රතිපත්තීන් ක්‍රියාවට නැංවීම සඳහා ස්ථාපනය කරන ලද අමාත්‍යාංශ අතරට එක්වූ අභිනව අමාත්‍යාංශයක් ලෙස මෙම අමාත්‍යාංශය යටතට පැවරෙන වගකීම හා කාර්ය භාරය සැබැවින්ම ගතික මෙන්ම අභියෝගාත්මකය. මාස 60 කින් අළුත් රටක් හදන පංච විධ ප්‍රතිපත්තිය ඔස්සේ රජය විසින් රට ගෙනයාමට අපේක්ෂා කරන ඉලක්කයන් කරා ළඟ වීමේදී ප්‍රාථමික කර්මාන්ත ක්ෂේත්‍රය තුළ කළ යුතු කාර්ය භාරය ඉතා විශාලය.

කෘෂිකාර්මික, ධීවර මෙන්ම අනෙකුත් සියළුම ක්ෂේත්‍රවල ප්‍රාථමික කර්මාන්ත නිෂ්පාදනයන්හි පොදුවේ දක්නට ලැබෙන ගැටළුවක් ලෙස අදාළ නිෂ්පාදන දේශීය වෙළෙඳ පොළට මෙන්ම අපනයන වෙළෙඳ පොළට ඉදිරිපත් කිරීමේදී අමුද්‍රව්‍ය ලෙස හෝ අර්ධ නිමි භාණ්ඩ ලෙස යැවීම ප්‍රධානනම ගැටළුවකි. එමගින් වෙළෙඳ පොළ තුළ, විශේෂයෙන් අපනයන වෙළෙඳ පොළ තුළ තරගකාරීත්වයට යොමු වීමේදීවිශාල අවාසිදායක තත්ත්වයන්ට මුහුණ දීමට එම නිෂ්පාදනයන්ට මෙන්ම ව්‍යාපාරිකයන්ටද සිදුවේ. එමගින් විශාල විදේශ විනිමය ප්‍රමාණයක් රටට අහිමි වන අතර, එය රටේ දළ ජාතික නිෂ්පාදිතයට ප්‍රාථමික කර්මාන්ත ක්ෂේත්‍රයෙන් ලැබෙන දායකත්වය පහළ මට්ටමක පැවතීම කෙරෙහි සෘජුවම බලපා තිබේ.

මෙම තත්ත්වය තුළ වර්ෂ 2020 දී අපගේ අපනයන ආදායම දෙගුණ කිරීමේ ඉලක්කය කරා ළගා වීමේදී ප්‍රාථමික කර්මාන්ත ක්ෂේත්‍රයේ නිෂ්පාදනයන්හි විශේෂයෙන් අපනයන කෘෂි බෝග නිෂ්පාදනයන්හි අගය එකතු කිරීමේ ක්‍රියාදාමය ශක්තිමත් කිරීම තුළින් අගය එකතු කළ නිමි භාණ්ඩ ගෝලීය වෙළෙඳ පොළට ඉදිරිපත් කොට හා එතුළින් ගෝලීය වෙළෙඳ පොළෙන් සැලකිය යුතු කොටසක් අත්පත් කර ගැනීම මගින් අදාළ ඉලක්ක සපුරා ගැනීමට අමාත්‍යාංශයේ සියළු වැඩසටහන් යොමු කර ඇත.

මේ සඳහා සුවිශේෂී මග පෙන්වීමක් අපගේ ගරු අමාත්‍යතුමන් වෙතින් නිරන්තරයෙන් ලැබෙන අතර, අතිරේක ලේකම්වරුන් ඇතුළු ජ්‍යෙෂ්ඨ නිලධාරීන් හා සමස්ථ කාර්ය මණ්ඩලය ඊට නිබඳවම කැපවී සිටින බවද සඳහන් කළ යුතුය.

එමෙන්ම අමාත්‍යාංශය ස්ථාපනය කොට ගතවූ කෙටි කාලයක් තුළ ලබාගත් ප්‍රගතිය සම්බන්ධයෙන් ඊට ඉඳුරාම දායක වූ සියළුම නිලධාරීන්ට මාගේ කෘතඥතාවය පළ කිරීමට මෙය අවස්ථාවක් කර ගන්නා අතර මෙම වාර්තාව සකස් කිරීමේ කාර්යයේ නියැළුන අධ්‍යක්ෂ (සැළසුම්) ඇතුළු සැළසුම් අංශයේ නිලධාරීන්ටද මාගේ ස්තුතිය හිමිවේ.

ඉංජි. බන්දුල වික්‍රමාරච්චි

ලේකම්

# පටුන


| | |
|---|---|
| ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය | 01 - 10 |
| පසුබිම සහ හැඳින්වීම | 01 - 02 |
| අමාත්‍යාංශයේ දැක්ම, මෙහෙවර, අරමණු | 02 |
| කාර්ය භාරය | 02 - 04 |
| අමාත්‍යාංශයේ අනුමත කාර්ය මණ්ඩලය | 04 |
| අමාත්‍යාංශයේ සංවිධාන සටහන | 05 |
| අමාත්‍යාංශ ප්‍රගතිය | 06 - 09 |
| 2016 වසරේ ක්‍රියාත්මක කෙරෙන සංවර්ධන වැඩසටහන්/ව්‍යාපෘති | 09 |
| ගැටළු හා අභියෝග | 10 |
| අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන දෙපාර්තමේන්තු/ ආයතන | 11 |
| අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 12 - 15 |

# ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය

## පසුබිම හා හැඳින්වීම

ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය නමින් වන මෙම නව අමාත්‍යාංශය 2015 සැප්තැම්බර් මස 22 වැනි දින අභිනවයෙන් ස්ථාපනය කරන ලද අතර බත්තරමුල්ල, සුහුරුපාය ගොඩනැගිල්ලේ 16 වන මහලේ සිය කාර්යාලය පිහිටුවා ඇත. 2015 සැප්තැම්බර් මස 21 වැනි දින නිකුත් කරන ලද අති විශේෂ ගැසට් නිවේදනය අනුව ප්‍රාථමික කර්මාන්ත විෂයයට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසුවිපරම් කිරීම හා ඇගයීම යන විෂයයන් මෙම අමාත්‍යාංශය යටතට පැවරෙන ප්‍රධාන කාර්යය සහ කර්තව්‍යයන් වේ.

එමෙන්ම ප්‍රාථමික කර්මාන්ත නිෂ්පාදනයන් සඳහා අගය එකතු කිරීම, අපනයන වෙළෙඳ පොළ අවස්ථා වැඩි දියුණු කිරීම, කර්මාන්ත සුරක්ෂිතතාවය ඇති කරමින් ගොවීන් ධීවරයින් සහ කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාරිකයින් ගෝලීය ආර්ථිකය වෙත යොමු කිරීම සඳහා ප්‍රතිපත්ති, උපාය මාර්ග සම්පාදනය කිරීමද අමාත්‍යාංශ විෂය ක්ෂේත්‍රයේ කාර්යයන් සහ කර්තව්‍යයන් අතරට අයත්වේ.

මීට අමතරව, අගය එකතු කළ නිෂ්පාදනද ඇතුළුව තිරසර සම්පත් භාවිතය සහ ජෛව ආරක්ෂණය සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම අමාත්‍යාංශයට පැවරෙන තවත් කර්තව්‍යයකි.

අමත්‍යාංශය යටතට පැවරී ඇති කාර්යයන් සහ කර්තව්‍යයන් අතර කෘෂිකාර්මික සංවර්ධන කළාප හා ධීවර අපනයන සංවර්ධන කළාප ස්ථාපනය කිරීම හා සම්බන්ධ කටයුතුද සුවිශේෂී කාර්යභාරයක් ලෙස සඳහන් කළ හැක.

මෙම අමාත්‍යාංශය ස්ථාපනය කිරීමේදී ප්‍රාථමික කර්මාන්ත ක්ෂේත්‍රයේ මෙන්ම විශේෂයෙන්ම කෘෂිකාර්මික හා ධීවර ක්ෂේත්‍රයේ නිෂ්පාදනයන් සහ ඒවායේ අපනයනයන් සම්බන්ධයෙන් මුහුණ දී ඇති ගැටළු වලට විසඳුම් සෙවීම කෙරෙහි සුවිශේෂී අවධානයක් යොමුකර ඇත. ඒ අනුව ශ්‍රී ලංකාවේ ප්‍රාථමික කර්මාන්ත ක්ෂේත්‍රයේ මෙන්ම කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ දක්නට ලැබෙන ගැටළු රාශියක් ඇති අතර, ඉන් අප අමාත්‍යාංශයේ විෂය පථය යටතට අයත් වන ගැටළුවක් ලෙස අපගේ ප්‍රාථමික කර්මාන්ත, කෘෂිකාර්මික සහ ධීවර නිෂ්පාදනයන් අමු ද්‍රව්‍ය ලෙස හෝ අර්ධ නිමි නිෂ්පාදන ලෙස ලෝක වෙළෙඳ පොළට ඉදිරිපත් කිරීම සුවිශේෂීව හඳුනා ගෙන ඇත. එම තත්ත්වය මත ගෝලීය වශයෙන් වෙළෙඳ පොළෙහි පවත්නා තරගයට මුහුණ දීමට එම නිෂ්පාදකයන්ට හා නිෂ්පාදනයන්ට ඇතිවන අපහසුතාවය මත ඒ සඳහා තරගකාරී මිළක් ලබා ගැනීමට නොහැකි වීමෙන් රටට ලබා ගත හැකිව තිබෙන විශාල විදේශ විනිමය ප්‍රමාණයක් අහිමිවී යාමක් ලෙස මෙම ගැටළුව වඩාත් කැපී පෙනේ.

මෙම තත්ත්වය තුළ ඉහත ගැටළුවට අදාළ විසඳුම් සෙවීම ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය වෙත පැවරී ඇති සුවිශේෂී කාර්යය භාරයකි. මේ සඳහා ඉහත විස්තර කරන ලද කාර්යයන් සහ කර්තව්‍යයන් ඔස්සේ අමාත්‍යාංශය මගින් නව වැඩසටහන් සැළසුම් කර දීප ව්‍යාප්තව ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන ඇත.

එම වැඩසටහන් අතර කෘෂිකාර්මික සංවර්ධන සහ ධීවර සංවර්ධන අධි කළාප (Development Mega Zones) පිහිටුවීම වඩාත් විශේෂිත හා ප්‍රමුඛතම වැඩසටහනක් ලෙස හඳුන්වා දිය හැකිව ඇත.

ඒ අනුව කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ පවත්නා ඉහතකී ගැටළු වලට විසඳුම් සෙවීම පරමාර්ථය කොට ගෙන කෘෂිකාර්මික සංවර්ධන අධි කළාප (Agricultural Development Mega Zones) පිහිටුවීමට අමාත්‍යාංශය මගින් කටයුතු කරගෙන යනු ලබන අතර, එය "මාස 60 කින් අළුත් රටක් හදන පංච විධ ක්‍රියාවලිය" ප්‍රතිපත්ති ප්‍රකාශය මගින්ද අවධාරණය කොට ඇත. මේ යටතේ "ගෝලීය

ගෙවත්ත" තේමා කොට ගත් කෘෂිකාර්මික සංවර්ධන අධි කළාප 23 ක් හා ධීවර අපනයන සංවර්ධන කළාප 10 ක් පිහිටුවීමට යෝජනා කොට ඇති අතර 2016 වර්ෂයේදී මෙවැනි අධි කළාප 07 ක් (කෘෂි අධි කළාප 05 ක්, ධීවර අධි කළාප 02ක්) පිහිටුවීමේ මූලික කටයුතු දැනටමත් ආරම්භ කොට ඇත. ඒ අනුව අපනයනාභිමුඛ (Export oriented) නව කෘෂි හා ධීවර නිෂ්පාදන හා සේවා ව්‍යාපාර ආරම්භ කිරීමට සහ දැනටමත් පවත්නා ව්‍යාපාර පුළුල් කර ගැනීමට අපේක්ෂා කරන ව්‍යවසායකයින් හා ආයෝජකයින් දිරි ගැන්වීම සඳහා අවශ්‍ය භෞතික හා ආර්ථික යටිතල පහසුකම් ඇති කරමින් රාජ්‍ය හා පෞද්ගලික අංශයන් සුහදශීලීව සම්බන්ධ කෙරෙන සුවිශේෂීවූ කළාපයන් ලෙස මෙම සංවර්ධන අධි කළාප හැඳින්විය හැක.

**දැක්ම**

අගය එකතු කළ ප්‍රාථමික කර්මාන්ත නිෂ්පාදන අපනයනයෙන් ජයගත් ගෝලීය වෙළෙඳ පොළක්

**මෙහෙවර**

ශ්‍රී ලාංකීය ප්‍රාථමික කර්මාන්ත නිෂ්පාදන ඵලදායීතාවය ඉහළ නැංවීම හා අගය එකතු කළ නිෂ්පාදන තුළින් ගෝලීය වෙළෙඳ පොළට ප්‍රවිශ්ඨවීම මගින් විදේශ විනිමය ඉපයීම ඉහළ නැංවීම සහ ක්ෂේත්‍රයේ නියුතු සියළු පාර්ශවකරුවන්ට යහපත් තිරසාර ජීවන පැවැත්මක් තහවුරු කිරීම උදෙසා අවශ්‍ය අවශ්‍ය ප්‍රතිපත්ති, සැළසුම්, වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

**අරමුණු**

සුවිශාලවූ ගෝලීය වෙළෙඳ පොළට ඇතුළු වී අපගේ ප්‍රාථමික කර්මාන්ත නිෂ්පාදන, කෘෂිකාර්මික හා ධීවර නිෂ්පාදන, භාණ්ඩ හා සේවා සඳහා තරගකාරීව එම වෙළෙඳ පොළෙන් සැලකිය යුතු කොටසක් අත් පත් කර ගැනීම තුළින් ශ්‍රී ලංකාවේ අපනයන ආදායම වසර 2020 වන විට දෙගුණ කර ගැනීමට දායක වීම (විශාල විදේශ විනිමය ප්‍රමාණයක් උපයා ගැනීම) අමාත්‍යාංශය පිහිටුවීමේ සුවිශේෂී හා මූලික අරමුණයි.

එමෙන්ම ඉදිරියේදී ශ්‍රී ලංකාව තුළත්, කලාපයේ අනෙකුත් රටවල් අතරත් ආහාර උදෙසා ඇතිවන අධික ඉල්ලුම සපුරාලීම සඳහා කෘෂිකාර්මික ක්ෂේත්‍රයෙන් ශ්‍රී ලංකාවේ ගැමි ආර්ථිකය සූදානම් කිරීම (සංවර්ධන අධි කළාප පිහිටුවීම ඔස්සේ) අමාත්‍යාංශයේ තවත් පරමාර්ථයක් වන අතර එය ඉහතින් දැක්වූ මූලික අරමුණ මුදුන් පමුණුවා ගැනීම සඳහා මහගු පිටිවහලක්ද වේ.

**කාර්යභාරය**

අපගේ දැක්ම යථාර්ථයක් බවට පත් කර ගැනීමට නිශ්චය කර ගත් මෙහෙවර ඔස්සේ යමින් ඉහත අරමුණු මුදුන්පත් කර ගැනීම සඳහා මතු දැක්වෙන කාර්යභාරය ඉටු කිරීමට අමාත්‍යාංශය මගින් දැනටමත් සැලසුම් සකස් කර ඇති අතර ඒ සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග ගනිමින් සිටී.

1. පුළුල් වශයෙන් කෘෂි හා ධීවර නිෂ්පාදනද අතුළුව ප්‍රාථමික කර්මාන්ත නිෂ්පාදනයන්හි අගය දාමය ශක්තිමත් කරමින් අගය එකතු කළ නිමි භාණ්ඩ නිෂ්පාදනය සඳහා පාර්ශවකරුවන් පෙළඹවීම

2. ප්‍රාථමික කර්මාන්ත නිෂ්පාදනයන්හි, විශේෂයෙන් අපනයන කෘෂි බෝගද ඇතුළුව අපනයන වටිනාකමක් ඇති අනෙකුත් බෝග නිෂ්පාදනයන්හි ගුණාත්මකභාවය තහවුරු කිරීම සඳහා අවශ්‍ය ප්‍රමිතීන් හඳුන්වාදීම හා සහතික කිරීම් සිදු කිරීමට අවශ්‍ය පහසුකම් හා දිරි ගැන්වීම් ලබා දීම

3. ප්‍රාථමික කර්මාන්ත ක්ෂේත්‍රයේ නිරතවන්නන්, ආයෝජකයින්, ගොවීන්, සුළු පරිමාණ කර්මාන්තකරුවන්, සේවා සපයන්නන් හා ව්‍යවසායකයින් ඇතුළු පාර්ශවකරුවන් ජාල ගත කොට ජනතා සමාගම් වැනි සාමූහික සංවිධාන තුලින් හා පෞද්ගලික ව්‍යාපාරිකයන් වශයෙන් ගෝලීය වෙළෙඳ පොළට අනුබද්ධ කිරීම

4. ගෝලීය වෙළෙඳ පොළ තුළ පවත්නා තරගකාරීත්වය ජය ගැනීම සඳහා ඉහළ නිෂ්පාදන ඵලදායීතාවයක් පවත්වා ගෙන යාමට අවශ්‍ය පහසුකම් ශ්‍රී ලාංකික ව්‍යාපාරිකයන්ට ලබාදීම හා ඒ සඳහා දේශීය හා විදේශීය වශයෙන් අලෙවි ප්‍රවර්ධන වැඩසටහන්, සම්මන්ත්‍රණ හා වෙළෙඳ සල්පිල් සංවිධානය කිරීම

5. ගෝලීය වශයෙන් තරගකාරී විදේශීය සමාගම් සමග ව්‍යාපාර ඇරඹීමට ලාංකික ව්‍යාපාරිකයන්ට අවශ්‍ය දිරි ගැන්වීම් ලබාදීම

6. විශේෂයෙන්ම කෘෂිකාර්මික හා ධීවර සංවර්ධන අධි කළාප ඔස්සේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාවසායකයින් සඳහා සිය ව්‍යාපාර ආරම්භ කිරීමට අවශ්‍ය ඉඩම් සපයාදීම සහ ඒ සඳහා අවශ්‍ය අනුබල හා දිරි ගැන්වීම් ලබා දීම

7. නව තාක්ෂණික යන්ත්‍රෝපකරණ, පසු අස්වනු තාක්ෂණය, කෘෂි ණය ඇතුළු සියළු භෞතික හා ආර්ථික යටිතල පහසුකම් නව ව්‍යවසායකයින් සඳහා අධි කළාප තුළ ඇති කිරීම

8. කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ ඩිජිටල්කරණය කරන ලද තොරතුරු පද්ධතියක් පවත්වා ගැනීම

9. අපනයන බෝග, පලතුරු වගාව, මල් වගාව, ඉහළ අපනයන වටිනාකමක් ඇති වෙනත් බෝග නිෂ්පාදන ප්‍රවර්ධනය සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම

මීට අමතරව ඉහත දක්වන ලද සංවර්ධන කාර්යයන් මෙහෙයවීම සඳහා අමාත්‍යාංශයට අයත් එකම දෙපාර්තමේන්තුව වන අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අවශ්‍ය මග පෙන්වීම ලබා දෙමින් පහත සඳහන් පරිපාලනමය කාර්යයන්ද ඉටු කරනු ලබයි

1. අමාත්‍යාංශය සඳහා වාර්ෂික සංවර්ධන සැලැස්ම හා මධ්‍ය කාලීන ආයෝජන සැලැස්ම සකස් කර ඉදිරිපත් කිරීම ඔස්සේ අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කරවා ගැනීම හා එම

ප්‍රතිපාදන යොදා ගනිමින් අදාළ වැඩසටහන් හා ව්‍යාපෘති අධීක්ෂණය, මෙහෙයවීම හා ප්‍රගති පාලන කටයුතු සිදු කිරීම

2. අමාත්‍යාංශයට අනුබද්ධිත දෙපාර්තමේන්තුවේ වාර්ෂික සැලැස්ම හා ඇස්තමේන්තු සකස් කිරීම සඳහා අවශ්‍ය සහාය හා මගපෙන්වීම් ලබා දීම, මෙහෙයවීම හා අධීක්ෂණ කටයුතු

3 අමාත්‍යාංශය වෙත වාර්ෂිකව වෙන් කෙරෙන ප්‍රතිපාදන ප්‍රශස්තව උපයෝගී කර ගනිමින් රාජ්‍ය මූල්‍ය කළමනාකරණය කිරීම සඳහා මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ අනුව යමින් ගිණුම් කටයුතු නිසි පරිදි පවත්වා ගෙන යාම

4 අමාත්‍යාංශයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මානව සම්පත් හා භෞතික සම්පත් කළමනාකරණය සහ අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පරිපාලන කටයුතු හා ආයතනික කටයුතු සම්බන්ධීකරණය කිරීම

## අමාත්‍යාංශයේ අනුමත කාර්ය මණ්ඩලය

| | | | | | |
|---|---|---|---|---|---|
| **ලේකම්** | | | | | |
| | **අතිරේක ලේකම් (පාලන හා මුදල්)** | | | **අතිරේක ලේකම් (තාක්ෂණ හා සංවර්ධන)** | |
| **අංශය** | පරිපාලන අංශය | මූල්‍ය අංශය | අභ්‍යන්තර විගණන අංශය | සැළසුම් අංශය | සංවර්ධන අංශය |
| **අංශ ප්‍රධානීන්** | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | ප්‍රධාන ගණකාධිකාරී | - | අධ්‍යක්ෂ (සැළසුම්) | අධ්‍යක්ෂ |
| **සෙසු විධායක කාර්ය මණ්ඩලය** | සහකාර ලේකම්/ පරි. නිලධාරී | ගණකාධිකාරී | අභ්‍යන්තර විගණක | නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ (සැළසුම්) | නි./සහකාර අධ්‍යක්ෂ 02 |
| **සංවර්ධන නිලධාරී/ සංවර්ධන සහකාර** | සංවර්ධන නිලධාරීන් / සංවර්ධන සහකාර 16 | | | | |
| **කළමනාකරණ සහ. සේවා/ සෙසු** | කළමනාකරණ සහකාර 18, කැමරා ශිල්පී/සහායක 03 | | | | |
| **සහාය කාර්ය මණ්ඩලය** | කාර්යාල කාර්ය සහායක/ රියැදුරු 19 | | | | |

# Organizational Chart of the Ministry



## 2015 වසරේ අමාත්‍යාංශයේ ප්‍රගතිය

- **භෞතික ප්‍රගතිය (2015.09. 22 සිට 12. 31 දක්වා)**

1. අමාත්‍යාංශය යටතේ ඉදිරියේදී දියත් කිරීමට අපේක්ෂිත සුවිසල් සංවර්ධන වැඩසටහන් මෙහෙයවීම සඳහා අවශ්‍ය මානව හා භෞතික සම්පත් සහ පරිසරය සකස් කිරීම

**A** අමාත්‍යාංශයේ නිත්‍ය කාර්ය මණ්ඩලය සඳහා තනතුරු 62 කින් යුත් කාර්ය මණ්ඩලයක් අනුමත කරවා ගත් අතර දෙසැම්බර් 31 වන විට අත්‍යවශ්‍යම තනතුරු 28 ක් සඳහා සේවක යොදවා ගැනීමට හැකිවිය

**B** නවීන හා අංග සම්පූර්ණ පහසුකම් වලින් යුත් නව කාර්යාල පරිශ්‍රයක් බත්තරමුල්ල, සුහුරුපාය නව ගොඩනැගිල්ලේ ස්ථාපනය කිරීම









**C** ප්‍රාථමික කර්මාන්ත නිෂ්පාදන (විශේෂයෙන් අපනයන කෘෂි බෝග) අපනයන ක්ෂේත්‍රයේ නියැලී සිටින නිෂ්පාදකයන්, සැපයුම්කරුවන්, ආයෝජකයන් ඇතුළු පාර්ශවකරුවන් සඳහා පහසුකම් සැලසීම පිණිස සේවා පියසක් ලෝක වෙළෙඳ මධ්‍යස්ථාන ගොඩනැගිල්ලේ ස්ථාපනය කිරීම සඳහා මූලික පියවර ගැනීම

**D** මානව සම්පත් සංවර්ධනය වෙනුවෙන් විදේශ පුහුණු වැඩසටහන් හා වැඩමුළු සඳහා නිලධාරීන් 04 දෙනෙකු හා ජාත්‍යන්තර වෙළෙඳ ප්‍රදර්ශන සඳහා නිලධාරීන් 03 දෙනෙකු සහභාගී කරවීම

**E** දකුණු කොරියානු සංවර්ධනයේ පදනමවූ සෙමාවුල් උන්ඩොං වැඩසටහන යටතේ ක්‍රියාත්මක වන ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය අමාත්‍යාංශය යටතට පවරා ගැනීම

2. ගරු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන්, අමාත්‍යාංශයේ හා අපනයන කෘෂිකර්ම දෙපාර්තමේතුවේ සහ ඒ ඒ දිස්ත්‍රික්කවල අපනයන කෘෂිකර්ම ක්ෂේත්‍රයේ පාර්ශවකරුවන්ගේ සහභාගීත්වයෙන් එම ක්ෂේත්‍රයේ ඉදිරි වැඩසටහන් හා සැළසුම් සකස් කිරීම සඳහා පහත දැක්වෙන වැඩමුළු සංවිධානය කොට පවත්වන ලදී

**A** අපනයන කෘෂි ක්ෂේත්‍රයේ පවත්නා ගැටළු හඳුනා ගැනීම හා ඉදිරි සැළසුම් සකස් කිරීම සඳහා අදාළ පාර්ශවකරුවන්ගේ සහභාගීත්වයෙන් 2015. 09. 28 වන දින මාතලේ අපනයන කෘෂිකර්ම බෝග පර්යේෂණ මධ්‍යස්ථායේදී වැඩ මුළුවක් පැවැත්වීම සහ මාතලේ කුළු බඩු අරණ නිරීක්ෂණ චාරිකාවක් ගරු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් සිදු කිරීම





**B** කුරුඳු නිෂ්පාදන හා අපනයන ක්ෂේත්‍රයේ නියැලී සිටින පාර්ශවකරුවන් මුහුණ දී ඇති ගැටළු සාකච්ඡා කිරීම හා ඒවාට විසඳුම් සෙවීමත්, කුරුඳු නිෂ්පාදනයන්හි අගය වැඩි කර අපනයනය කිරීමත් උදෙසා ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳ වැඩ මුළුවක් ගරු ඇමතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2015. 11. 12 වන දින ගාල්ලේදී පැවැත්වීම හා ගාල්ල ආශ්‍රිත කලාපය කුරුඳු අපනයන සැකසුම් කලාපයක් ලෙස වැඩි දියුණු කිරීමට අවශ්‍ය මූලික කටයුතු ආරම්භ කිරීම.







**C** මාතලේ, මහනුවර, කෑගල්ල සහ නුවරඑළිය දිස්ත්‍රික්ක වල ගම්මිරිස්, කරාබු, සාදික්කා යන බෝග අපනයන අපනයන ක්ෂේත්‍රයට සම්බන්ධ පාර්ශවකරුවන් දැනුවත් කිරීමේ

සාකච්ඡාවක් ගරු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් 2015. 11. 17 වන දින පෙර වරුවේ මහනුවර ගැටඹේදී පැවැත්වීම හා ජාතික කුළු බඩු උද්‍යානය නිරීක්ෂණය.









**D** කුරුණෑගල දිස්ත්‍රික්කයේ ප්‍රධාන අපනයන කෘෂිකාර්මික බෝග වශයෙන් සැලකෙන ඉඟුරු, කහ, බුලත් ප්‍රමුඛව අනෙකුත් අපනයන බෝග ක්ෂේත්‍රයේ පවත්නා ගැටළු සම්බන්ධයෙන් එම වගාවන්හි නියැළී සිටින වගා කරුවන් හා අදාළ අනෙකුත් පාර්ශවකරුවන් සමග 2015. 11. 17 වන දින පස් වරුවේ සාකච්ඡාවක් ගරු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වීම







**E** ජනාධිපති ලේකම් කාර්යාලයේ මෙහෙයවීමෙන් ක්‍රියාත්මක වන ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහනට සමගාමීව උතුරු, පළාතේ, යාපනය සහ කිලිනොච්චි දිස්ත්‍රික්කකවල අපනයන කෘෂි බෝග අක්කර 4000 ක් වගා කිරීම සඳහා අවශ්‍ය මූලික කටයුතු සහ නිලධාරීන් දැනුවත් කිරීම ගරු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වීම.









**F** අපනයන කෘෂිකර්ම අනාගත ක්ෂේත්‍රයේ උන්නතිය සඳහා කුළු බඩු කවුන්සිලයේ සාමාජිකයින් හා නිලධාරීන් සමග ගරු අමාත්‍යතුමන්ගේ නිරීක්ෂණය








## මූල්‍ය ප්‍රගතිය (2015.09. 22 සිට 12. 31 දක්වා)

| වැඩසටහන/ව්‍යාපෘතිය | අනුමත ප්‍රතිපාදන (රු.) | වැය කළ මුදල (රු.) | මූල්‍ය ප්‍රගතිය % |
|---|---|---|---|
| පුණරාවර්ථන වියදම් | 34,260,000 | 16,868,103 | 49.24 |
| ප්‍රාග්ධන වියදම් | 12,718,149 | 6,647,072 | 52.26 |
| එකතුව | 46,978,149 | 23,515,175 | 50.06 |

**2016 වසරේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සංවර්ධන වැඩසටහන්/ ව්‍යාපෘති**

**2016 අයවැය ඇස්තමේන්තු අනුව යෝජිත වැඩසටහන්**

| වැඩසටහන/ ව්‍යාපෘතිය | වෙන් කර ඇති මුදල (රු. මි.) |
|---|---|
| ප්‍රාග්ධන වියදම් | 526.15 |
| පුණරාවර්තන වියදම් | 768.09 |
| ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහන (කහ සහ ඉඟුරු වගා සංවර්ධනය) | 50.00 |
| එකතුව (අ.කෘ.දෙ. ප්‍රතිපාදනද ඇතුළත්ව) | 1344.24 |

## අයවැය යෝජනා අනුව යෝජිත වැඩසටහන්

| වැඩසටහන/ ව්‍යාපෘතිය | වෙන් කර ඇති මුදල (රු. මි.) |
|---|---|
| කෘෂි, පශු සම්පත් හා ධීවර සැකසුම් කළාප පිහිටුවීම | 100.00 |
| අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කුරුඳු පර්යේෂණ ඒකකය ශක්තිමත් කිරීම | 50.00 |
| කුරුඳු සංවර්ධන අධිකාරිය ස්ථාපනය කිරීම | 50.00 |
| කුරුඳු පුහුණු පාසැල වැඩි දියුණු කිරීම | 50.00 |
| කුරුඳු පර්යේෂණ කටයුතු සඳහා පහසුකම් සැලසීම | 50.00 |
| විශේෂිත කෘෂිකාර්මික හා ධීවර අපනයන අධි කළාප ස්ථාපනය කිරීම | 2000.00 |
| ප්‍රාථමික කර්මාන්ත කවුන්සිලය ස්ථාපනය කිරීම | - |
| පුවක් වගාව හා ආශ්‍රිත නිෂ්පාදන වානිජ්‍යකරණය | - |
| වානිජ පළතුරු වගාව හා එළවළු වගා සංවර්ධනය | - |
| රැකියා විරහිත තරුණයින් හට ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා ආයෝජන සහන සැලසීම | - |
| **එකතුව** | 2300.00 |

**නව අමාත්‍යාංශයක් ලෙස ජය ගැනීමට ඇති ගැටළු හා අභියෝග**

දේශීය නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීමේදී මුහුණදීමට සිදුවන ගැටළු හා බාධක

- o දේශීය ගොවියා නගා සිටුවීමට බාධාකාරී වන ආනයන. උදා ඃ කහ සහ ඉගුරු ආනයනය සඳහා තීරු බදු සහන ලබා දීම
- o දේශීය නිෂ්පාදන අපනයනයේදී මුහුණ දෙන ශාඛ හා සත්ත්ව නිරෝධායන සීමා. උදා ඃ නැවුම් පළතුරු (අඹ වැනි) අපනයනයේදී පවත්නා ගැටළු
- o අගය එකතු කළ නිෂ්පාදන හා ව්‍යවසායකයින් දිරි ගැන්වීම සඳහා සැකසුම් කර්මාන්ත ප්‍රවර්ධනය කිරීමේදී මුහුණ දෙන ගැටළු.
  උදා ඃ අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර හා ඇසුරුම් ආනයනයේදී බලපාන තීරු බදු සීමාවන්.
- o උසස් කීර්ති නාමයක් සහිත ශ්‍රී ලාංකික නිෂ්පාදන වලට තත්ත්වයෙන් බාල නිෂ්පාදන මිශ්‍රකිරීම හා ආදේශ කිරීම.
  උදා ඃ කසල තේ මිශ්‍රකිරීම හා ශ්‍රී ලංකාවේ පුවක් වෙනුවට ශ්‍රී ලංකා නාමය භාවිතා කරමින් වෙනත් රටවල පුවක් ශ්‍රී ලංකාවේ සිට ප්‍රති අපනයනය
- o අගය එකතු කළ නිෂ්පාදන වෙනුවට තවදුරටත් අමු ද්‍රව්‍ය හෝ අර්ධ නිමි නිෂ්පාදන ලෙස වෙළෙඳ පොළට ඉදිරිපත් කිරීමට ගොවීන්, නිෂ්පාදකයන් පෙළඹී සිටීම
  උදා ඃ කුරුඳු, ගම්මිරිස්
- o ශ්‍රී ලංකාවට පමණක් ආවේණික වූ නිෂ්පාදනයන්හි පවත්නා ඖෂධීය ගුණය හා රසායනික වටිනාකම් පිළිබඳ කෙරෙන පර්යේෂණ හා සොයා ගැනීම් ඉතා මන්ද ගාමීව පැවතීම.
  උදා ඃ ශ්‍රී ලංකාවට පමණක් ආවේණික වූ කුරුඳු සම්බන්ධයෙන් වැඩි දුර පර්යේෂණ සිදු නොවීම

➢ නව ආයෝජකයින්ට ව්‍යාපෘති සඳහා ඉඩම් ලබා දීමේදී ඇතිවන ගැටළු. විශේෂයෙන් සංවර්ධන අධි කළාප සඳහා ආයෝජකයින් වෙත ඉඩම් ලබා දීමේදී මෙම ගැටළුව වඩාත් බලපා ඇත.

- o ඌණ උපයෝජිත ඉඩම් සංවර්ධන කාර්යයන්ට යෙදවීම පිණිස ලබාදීමේදී, අදාළ ඉඩම් අයත් රාජ්‍ය ආයතන සහ පෞද්ගලික සමාගම් විසින් එම ඉඩම් පවරා දීමට ඇති මැලිකම
- o එලෙස ඉඩම් පවරා ගැනීම සඳහා දීර්ඝ කාලයක් ගතවීම සහ සංකීර්ණ ක්‍රමවේදයක් අනුගමනය කළ යුතු වීම
- o ඉඩම් අයත් ආයතනවල නිලධාරීන් තුළ පවත්නා ඍණාත්මක ආකල්ප

# අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මන වන දෙපාර්තමේන්තු හා ආයතන

## අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

# අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

## පසුබිම හා හැඳින්වීම

ඈත අතීතයේ සිටම ශ්‍රී ලංකාව කුළු බඩු සම්බන්ධයෙන් කීර්තියක් අත් කර ගෙන තිබුණද එම කර්මාන්තයට ජාතික මට්ටමින් අවධානය යොමුකරන ලද්දේ 1971 ජාතික කෘෂිකාර්මික ප්‍රතිපත්තිය තුළිනි. ඉන් පසුව 1972 අමාත්‍ය මණ්ඩල සංදේශයකට අනුව වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයට අනුබද්ධව සුළු අපනයන බෝග දෙපාර්තමේන්තුව පිහිටුවනු ලැබීය. 1975 දී දෙපාර්තමේන්තුව කෘෂිකර්ම අමාත්‍යාංශය යටතට පත් කරන ලදි. ඒ දක්වා දෙපාර්තමේන්තුවේ කාර්යභාරය වූ ආන්තික තේ ඉඩම්වල කුළුබඩු බෝග වගා කිරීමේ කටයුත්ත වෙනුවට ලෝක ආහාර සංවිධානය (උකෘඕ) හා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) මගින් අරඹන ලද බෝග විවිධාංගීකරණ සංවර්ධන ව්‍යාපෘතිවල කාර්යභාරයෙන් කොටසක් දෙපාර්තමේන්තුව වෙත පැවරීමත් සමගම අපනයනය පාදක කර ගත් කුළුබඩු හා ආශ්‍රිත බෝග සංවර්ධනයේ නියමුවා බවට අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව පත් විය.

1992 අංක 46 දරණපාර්ලිමේන්තු පණත මගින් එවකට පැවති නාමය වෙනස් කොට දෙපාර්තමේන්තුව, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වශයෙන් නම් කරන ලද අතර එමගින් කුළුබඩු මෙන්ම සෙසු කෘෂිකර්ම නිෂ්පාදන අපනයනයට අදාළ නෛතික බලතල පැවරින. එතැන් පටන් ක්ෂේත්‍රයේ පර්යේෂණ හා සංවර්ධන කටයුතු සියල්ලක්ම මෙම දෙපාර්තමේන්තුව මගින් මෙහෙයවනු ලබයි.

ඒ අනුව කුළුබඩු ක්ෂේත්‍රයට ප්‍රවීනයන් වෙමින් එම ක්ෂේත්‍රයේ සංවර්ධන කටයුතු හා ව්‍යාප්තිය දිවයින පුරා ජාලයක් ස්ථාපිත කරමින් ක්ෂේත්‍රයේ අදාළ පාර්ශවකරුවන්ට පහසුකම් සලසා දීම මෙම වකවානුව තුලදී සිදුවිය.

අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මූලික අවධානය යොමුවී පවතිනුයේ කුරුඳු, ගම්මිරිස්, කරාබු නැටි, සාදික්කා, එනසාල්, කෝපි, කොකෝවා, පුවක්, පැගිරි, වැනිලා, සේර, බුලත්, ගොරකා, කිතුල්, ඉගුරු සහ කහ යන බෝග අපනයනය සඳහාය. ඒ සඳහා අත්‍යවශ්‍ය වන තාක්ෂණික දැනුම, නව නිපැයුම් හා ඉහළ අස්වැන්නක් ලබා දෙන ප්‍රභේද හඳුන්වාදීම ප්‍රධානතම වගකීම වන අතර අපනයන කෘෂි බෝග ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනය උදෙසා පර්යේෂණ සංවර්ධන කටයුතු හා ව්‍යාප්ති සේවා සැපයීම අඛණ්ඩව සිදු කරනු ලබයි. 1972 දී අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව පිහිටුවන ලද අවස්ථාවේ අපනයනය කරන ලද මුළු කෘෂි අපනයන බෝග පරිමාව මෙට්‍රික් ටොන් 7,587 ක් වූ අතර 2015 වසරේදී එය මෙට්‍රික් ටොන් 71,588.30 ඉක්මවන අගයක් ගැනීමට සමත්වූයේය. ඒ අනුව සමස්ථ විදේශ විනිමය ආදායම රු. මිලියන 48.9 සිට 2015 වසර වනවිට රු. මිලියන 61,558.34 දක්වා වර්ධනය වී තිබේ. 2015 වන විට වගා කරන ලද මුළු අපනයන බෝග වපසරිය හෙක්ටයාර 111,095 ක් වන අතර මිලියන 2 ක් පමණ පාර්ශවකරුවන් සෘජුව හා වක්‍රව මෙම ක්ෂේත්‍රයේ නියැලේ.

**දැක්ම**

කෘෂි නිෂ්පාදන අපනයනයෙන් විශිෂ්ටත්වය

**මෙහෙවර**

ජාතික අවශ්‍යතාවයන් හා වෙළෙඳ පොළ සඳහා දේශිය අවශ්‍යතාවයන් තහවුරු කරමින් නිෂ්පාදන අගය එකතු කර අපනයන හා ජාතික නිෂ්පාදන සුරකිමින් ප්‍රතිඅපනයනය කරමින් අපනයන කෘෂි බෝග ක්ෂේත්‍රයේ නිරත සියලු පාර්ශවකරුවන්ගේ තිරසාර ආර්ථික හා සමාජීය සංවර්ධනයත් පෙරදැරි කර ගනිමින්, අපනයන කෘෂි බෝග නිෂ්පාදනවල ප්‍රමාණාත්මක හා ගුණාත්මක ප්‍රවර්ධනයක් ඇති කිරීමට අවශ්‍ය වන්නාවූ පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාවලිය සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම.

**අරමුණු හා අභිමතාර්ථ**

පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාදාමයන් ඔස්සේ නිෂ්පාදනය, ඵලදායීතාවය හා නිෂ්පාදන තත්ත්වයන් වැඩිදියුණු කිරීම සහ අගය එකතු කළ නිෂ්පාදන ධාරිතාව වැඩිකිරීම මගින් අපනයන කෘෂි භෝග ක්ෂේත්‍රය දියුණු කරගැනීම සඳහා අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව කැපවී සිටී. දෙපාර්තමේන්තුව මගින් 2015 වසර තුළදී අපනයන කෘෂි බෝගවල අපනයන ධාරිතාව හා අපනයන ආදායම යන අංශ දෙකෙහිම සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කර තිබේ. අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් සංවර්ධන ක්‍රියාදාමයන් ඔස්සේ නව වගා සහ නැවත වගා ඇති කිරීම, උසස් කෘෂිකාර්මික පිළිවෙත් අනුගමනය කරමින් පවතින වගාවන්හි ඵලදායිතාව ප්‍රවර්ධනය කිරීම සහ අනෙකුත් රටවල් සමග තරග කිරීමේ හැකියාවක් ඇති ජාත්‍යන්තර ප්‍රමිතීන්ට හා වෙළෙඳ රීතීන්ට අනුගත වන පරිද්දෙන් නිෂ්පාදනයන්හි ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා ආධාර කිරීම මගින් මෙම අංශය වැඩිදියුණු කිරීමෙහි නිරතවේ. ආදායම් සුරක්ෂිතභාවය සඳහා පවතින පාරිභෝගික අවශ්‍යතාවයන් සපුරාලනු පිණිස උසස් තත්ත්වයේ නිෂ්පාදන කෙරෙහි වැඩි අවධානයක් යොමුකරනු ලැබේ. අපනයන කෘෂිකාර්මික බෝග වගා කිරීම, පිරිසැකසුම්කරණය, අගය එක් කරමින් නිමි භාණ්ඩ සැකසීම හා වෙළෙඳාමේ අතර මැදියන් වශයෙන් කටයුතු කරමින් ජීවනෝපාය සලසා ගන්නා මිලියන දෙකක පමණ පාර්ශවකරුවන්ගේ ජීවන තත්ත්වය සුරක්ෂිත හා ශක්තිමත් කිරීම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණ වේ.

**ආයතනික ව්‍යුහය**

**ප්‍රධාන කාර්යාලය**

පේරාදෙණියේ ගැටඹේ ප්‍රධාන කාර්යාලය පිහිටුවා ඇති අතර අධ්‍යක්ෂ ජනරාල් වරයෙකු යටතේ ක්‍රියාත්මකවේ. මේ යටතේ දිස්ත්‍රික් 14 ක සංවර්ධන වැඩසටහන් හා පර්යේෂණ මධ්‍යස්ථාන 07 ක සම්බන්ධීකරණය අධීක්ෂණය, පරිපාලනය හා ප්‍රගති සමාලෝචනය සිදු කෙරේ. වාර්ෂිකව රු. මිලියන 1000ක පමණ ප්‍රතිපාදන දෙපාර්තමේන්තු වැඩසටහන් සඳහා යොදවන අතර ප්‍රධාන කාර්යාලයේ 150ක පමණ නිලධාරීන්ද ඇතුළු1200ක පමණ කාර්ය මණ්ඩලයක් සේවය කරනු ලබයි.

**පර්යේෂණ මධ්‍යස්ථාන**

| | |
|---|---|
| අපනයන කෘෂිකර්ම මධ්‍යම පර්යේෂණ මධ්‍යස්ථානය | - මාතලේ |
| ජාතික කුරුඳු පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානය | - පලොල්පිටිය |
| අතුරු වගා සහ බුලත් පර්යේෂණ මධ්‍යස්ථානය | - නාරම්මල |
| පටක රෝපණ මධ්‍යස්ථානය | - වල්පිට |
| උප පර්යේෂණ මධ්‍යස්ථානය | - කුණ්ඩසාලේ |
| උප පර්යේෂණ මධ්‍යස්ථානය | - නිල්ලඹ |
| උප පර්යේෂණ මධ්‍යස්ථානය | - දැල්පිටිය |
| ආර්ථික පර්යේෂණ මධ්‍යස්ථානය | - ප්‍රධාන කාර්යාලය |

**දිස්ත්‍රික් කාර්යාල (14)**

| | | |
|---|---|---|
| මධ්‍යම පළාත | - | මහනුවර, මාතලේ, නුවරඑළිය |
| සබරගමුව පළාත | - | කෑගල්ල, රත්නපුර |
| ඌව පළාත | - | මොණරාගල, බදුල්ල |
| දකුණු පළාත | - | ගාල්ල, මාතර, හම්බන්තොට |
| බස්නාහිර පළාත | - | කොළඹ, ගම්පහ, කළුතර |
| වයඹ පළාත | - | කුරුණෑගල |

**ප්‍රධාන ක්‍රියාකාරකම්**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජ පාර්ලිමේන්තුවේ 1992 සැප්තැම්බර් 22 දිනැති අංක46 දරණ අපනයන කෘෂි බෝග ප්‍රවර්ධනය කිරීමේ පනත මගින් පහත සඳහන් කාර්යයන් හා සේවාවන් සඳහා අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට ව්‍යස්ථාපිත බලය පවරා දෙනු ලැබ තිබේ.

- අපනයන කෘෂි බෝග වගාව හා පිරිසැකසුම්කරණය සංවිධානය හා ප්‍රවර්ධනය
- බෝග සංවර්ධනය, බෝගවගාව, බෝගආරක්ෂණය, පසු අස්වනු කළමනාකරණය හා සමාජ ආර්ථික විද්‍යාව සම්බන්ධ බහු විෂයානුබද්ධ පර්යේෂණ සිදු කිරීම
- අපනයන කෘෂි බෝග වගාව හා පිරිසැකසුම්කරණය සංවිධානය හා ප්‍රවර්ධනය
- බෝග සංවර්ධනය, බෝගවගාව, බෝගආරක්ෂණය, පසු අස්වනු කළමනාකරණය හා සමාජ ආර්ථික විද්‍යාව සම්බන්ධ බහු විෂයානුබද්ධ පර්යේෂණ සිදු කිරීම
- ඉහළ ගුණාත්මකභාවයකින්යුත් රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය හා බෙදාහැරීම
- බෝග නිෂ්පාදනය, ඵලදායීතා වර්ධනය හා ගුණාත්මභාවය වර්ධනයට අදාළ අපනයන කෘෂි බෝග ආධාර යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම
- බෝග ආරක්ෂණ උපදේශන සේවා සැපයීම

- ඒකාබද්ධ පළිබෝධ කළමනාකරණය ප්‍රවර්ධනය
- ඒකාබද්ධ ශාක පෝෂණ කළමනාකරණය ප්‍රවර්ධනය
- කාබනික වගාව ප්‍රවර්ධනය, අලෙවිකරණය, ගුණාත්මක ප්‍රමිතීන් හා මිළ ගණන් ආදිය පිළිබඳ දත්ත නිකුත් කිරීම
- අපනයන කෘෂි බෝග හා රෝපණ ද්‍රව්‍ය ආනයනය පාලනය කිරීම
- අපනයන කෘෂි බෝග නිෂ්පාදනය, පිරිසැකසුම්කරණය, අලෙවියෙහි නියුතු පුද්ගලයන් හා අනෙකුත් පාර්ශවකරුවන් පුහුණු කිරීම
- වැවිලි අංශය තුළ අපනයන කෘෂි බෝග ප්‍රවර්ධනය සඳහා උපදේශන සේවා සැපයීම
- අපනයන කෘෂි බෝග ආශ්‍රිත රාජ්‍ය හා පෞද්ගලික ආයතන අතර සම්බන්ධතාව ශක්තිමත් කිරීම
- 1992 අංක 46 දරණ අපනයන කෘෂිකර්ම පනත යටතේ විධායක අධිකාරී බලය පැවරීම
- අපනයන කෘෂි බෝග ආශ්‍රිත ප්‍රතිපත්තිමය කාරණා සම්බන්ධයෙන් අනෙකුත් රාජ්‍ය සංවිධාන වෙත උපදෙස් සැපයීම
- තාක්ෂණික ආදර්ශන පවත්වා ගෙන යාම.

**2015 වසරේ විශේෂ සිදුවීම්**

- දෙපාර්තමේන්තුවේ ඵලදායිතාවය ඉහළ නැංවීම අරමුණු කර ගනිමින් අංශ අතර ඵලදායිතා තත්ත්ව කව පිහිටුවා ඵලදායිතා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමත් ලිපි ගොනු විධිමත් පරිදි සකස් කිරීමත් තුළින් දෙපාර්තමේන්තුවේ කටයුතු වඩාත් කාර්යක්ෂමව කිරීමට කටයුතු කරන ලදී.
- ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය, ශ්‍රී ලංකා පදනම් ආයතනය වැනි විවිධ පුහුණු ආයතන යටතේ නිලධාරීන් 83ක් පුහුණු වීම් සඳහා සහභාගි කරවන ලදී.
- ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ සහකාර අධ්‍යක්ෂ තනතුරක පුරප්පාඩු පුරවා ඇත.
- දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III ශ්‍රේණියේ ව්‍යාප්ති නිලධාරී තනතුරු 23ක් සඳහා නිලධාරීන් බඳවා ගන්නා ලදී.
- ඒකාබද්ධ රියදුරු සේවයේ තනතුරු පුරප්පාඩු 10ක් සඳහා නවක සේවකයන් බඳවා ගෙන ඇත.
- 2015 වර්ෂය තුළ සමස්ථ ප්‍රතිපාදනයෙන් 99% ක් වැය කෙරිණි.
- මූලධන වියදම් හා පුණරාවර්තන වියදම්වල කාර්ය සාධනය 99% ක් දක්වා වැඩි කර ගත හැකි විය.